මැදදුම්බර ප්‍රාදේශීය සභාව

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ (අර්ධ ශිල්පීය) ආදාහනාගාර ක්‍රියාකරු තනතුර වෙනුවෙන් III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරෙහි පවත්නා පුරප්පාඩු සඳහා විවෘත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාත තුළ යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු තනතුර	:	ආදාහනාගාර ක්‍රියාකරු
2. අනුමත බඳවා ගැනීමේ පටිපාටිය	:	මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික සේවයේ අර්ධ ශිල්පීය සේවා ව්‍යවස්ථා සංග්‍රහය
3. තනතුරේ ස්වභාවය	:	ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
4. වැටුප් කේත අංකය	:	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි PL - 02
5. වැටුප් පරිමාණය	:	රු. 41,800 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 65,560
6. බඳවා ගන්නා ශ්‍රේණිය	:	III ශ්‍රේණිය
7. අධ්‍යාපන සුදුසුකම්	:	(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම; හෝ (ii) ජාතික වෘත්තීය සුදුසුකම් හි (NVQ) 3 සුදුසුකම ලබා තිබීම (රා. ප. ව. 28/2016) අනුව
8. වෘත්තීය සුදුසුකම්	:	අදාළ නොවේ.
9. පළපුරුද්ද	:	මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
10. කායික සුදුසුකම්	:	සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
11. වෙනත්		(i) අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (පදිංචිය සනාථ කළ යුතුය.) (ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. (iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
12. වයස	:	අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
13. බඳවා ගැනීමේ ක්‍රමය	:	අයදුම්පතේ සඳහන් කරුණු අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව, පවතින පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

14. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	50	උපරිම ලකුණු ලබා ගත් අයදුම්කරු පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ.
තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රශ්න කිරීම	40	
සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය	10	
මුළු ලකුණු	100	

15. සේවා කොන්දේසි :	
I.	වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
II.	පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.
III.	අදාළ පත්වීම් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත්වේ.
IV..	මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත් සභාව හා මැදදුම්බර ප්‍රාදේශීය සභාව වරින්වර නිකුත් කරන නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
V.	පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
16. අයදුම් කිරීමේ අනුපිළිවෙල :	
I.	අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පමණක් සකස් කළ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර 2026.12.05 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බවට දන්වනු නොලැබේ.
II.	අයදුම්පතේ සඳහන් කරනු ලබන සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියවිලි වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
III.	අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ හෝ මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව මෙම ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.
17. අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :	
I.	ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-9 දක්වා කරුණුද දෙවන පිටෙහි 10-14 දක්වා කරුණුද තුන්වන පිටෙහි ඉතිරි ජේද ද ඇතුළත් වනසේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය මුද්‍රණය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කරගත යුතුය.

II.	අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් නොතාරිස්වරයෙකු, නීතීඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීක හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.
III.	යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලිපිය ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.
IV..	රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
18.	අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල මැදදුම්බර ප්‍රාදේශීය සභා ලේකම් සතුය.

ඩී. එම්. ඩී. අයි. කුමාරි,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2026 නොවැම්බර් මස 06 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.